# 10 ශ්‍රේණිය


# ඉතිහාසය


කියවීම් ද්‍රව්‍යය



## ඒකකය 2

## ශ්‍රී ලංකාව ජනාවාස වීම - 01





## ප්‍රාග් ඓතිහාසික ගල් යුගය


අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# ප්‍රාග් ඓතිහාසික යුගය

## ප්‍රාග් ඓතිහාසික යුගය හැඳින්වීම



සාහිත්‍ය මූලාශ්‍රය මගින් විස්තර කෙරෙන අතීත කාලයේ ආරම්භයට පෙර තිබූ යුගය පොදුවේ හැඳින් වෙන්නේ ප්‍රාග් ඓතිහාසික යුගය නමිනි. දැනට ලංකාවේ පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය ලෙස සලකනු ලබන්නේ දීප වංසය යි. එහි සඳහන් පැරණිතම ඓතිහාසික තොරතුරු අයත්වන්නේ බුද්ධකාලයට යි. බුදුන්වහන්සේ ලෝකයට පහළ වූයේ ක්‍රි.පූ 6 සියවසේ බව සාමාන්‍ය විශ්වාසයයි. එවිට ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ක්‍රි.පූ 6 සියවස දක්වා දිවෙන බව අවබෝධ කරගත හැකිය. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් ලැබෙන සාදක වසර 125000 පැරණිය.එම තොරතුරු ඉරණමඩු සැකැස්මෙන් අනාවරණය වේ. ඒ අනුව ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය මීට වසර 125000 කට ඉහතදී පටන්ගෙන ක්‍රිස්තු පූර්ව 600 දක්වා දිවෙන බව පැහැදිළි වෙයි. ආදි මානවයා භාවිතා කළ තාක්ෂණයේ පරිණතිය පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ප්‍රධාන වශයෙන් යුග දෙකකට බෙදා වෙන් කර ගත හැකිය.

1. ප්‍රාග් ඓතිහාසික ගල් යුගය ( ප්‍රාග් ඓතිහාසික යුගය)
2. පූර්ව ඓතිහාසික යුගය

මෙම යුග දෙක අතරින් මුල්ම හා දීර්ඝ කාලයක් පැවති යුගය ප්‍රාග් ඓතිහාසික ගල් යුගය යි. එය මීට වසර 125000 ක් ඉහත කාල වකවානුවකදී පටන්ගෙන ක්‍රිස්තු පූර්ව 1800 දක්වා පැවති බවට පුරා විද්‍යාත්මක සාදක හමු වේ. ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ විශේෂත්වය වන්නේ ඔවුන්ගේ එදිනෙදා කටයුතු සඳහා ශිලා

මෙවලම් භාවිතා කිරීමයි. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ විශේෂ ලක්ෂණය වන්නේ ඔවුන් යකඩ මෙවලම් භාවිතා කිරීමයි. එම නිසා එම යුගය මුල් යකඩ යුගය යනුවෙන් ද හැඳින් වේ. ශ්‍රී ලංකාවේ ආදි මානවයා ක්‍රිස්තු පූර්ව 2400 දී පමණ යකඩ භාවිතා කළ බවට සාදක බෙරගල සුසාන භූමියෙන් හමු වේ. එහිදී හමු වූ යබොර කැබැල්ල ක්‍රිස්තු පූර්ව 2400 ට කාල නිර්ණය කර ඇත. එම නිසා ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ක්‍රිස්තු පූර්ව 2400 පමණ පටන්ගෙන ක්‍රිස්තු පූර්ව 600 දක්වා දිවෙන බව විශ්වාස කෙරේ . ඒ අනුව ක්‍රිස්තු පූර්ව 2400 සිට 1800 දක්වා වූ කාලය මෙම යුග දෙකටම අයත් කලසීමාවක් ලෙස ගණන් ගත යුතුය.එම කාල වකවානුව ගල්යුගයෙන් පූර්ව ඓතිහාසික යුගයට සංක්‍රාන්තිය සිදු වූ අවධිය යි. මෙම යුගයේ මානවයා ගල් මෙවලම් සේම ශිලා මෙවලම් ද භාවිතා කර ඇත.

ප්‍රාග් ඓතිහාසික යුගය - වසර 125000 සිට ක්‍රිස්තු පූර්ව 600 දක්වා

ප්‍රාග් ඓතිහාසික ගල් යුගය - වසර 125000 සිට ක්‍රිස්තු පූර්ව 1800 දක්වා

පූර්ව ඓතිහාසික යුගය - ක්‍රිස්තු පූර්ව 2400 සිට ක්‍රිස්තු පූර්ව 600 දක්වා

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් සාදක හමුවන පරිසර කලාප දෙකක් හඳුනා ගත හැකිය.

ඉරණමඩු සැකැස්ම

රත්නපුරය අවට මැණික් පතල් වල ඉල්ලම් පස් තට්ටුව

ශ්‍රී ලංකාවේ අර්ධශුෂ්ක කලාපයේ පොළොවේ මැටි සහිත වැලි පසකින් වැසුණු බොරලු තට්ටුවක් තිබේ. පුරාවිද්‍යාඥයින් විසින් එය හඳුන්වා තිබෙන්නේ ඉරණමඩු සැකැස්ම යන නමිනි. ඉරණමඩු සැකැස්ම තැන්පත් වූයේ ප්ලයිස්ටොසීන යුගයේ පැවති කෙටි උණුසුම් කාලවල දී ය. මෙම බොරලු තට්ටුවෙන් ද මෙරට ගල්යුගයට අයත් මෙවලම් හා එම යුගයේ මානවයා ආහාරයට ගත් වඳවී ගිය සතුන්ගේ ඇටකැබලි හමු වී ඇත.



ශ්‍රී ලංකාවේ උතුරු අර්ධ ශුෂ්ක කලාපයේ හා දකුණු අර්ධ ශුෂ්ක කලාපයේ පිහිටි මෙම පාංශු සැකැස්ම මීට වසර **125000** පැරණි බවට කාල නිර්ණය කර ඇත. ශ්‍රී ලංකාවේ දකුණු පළාතට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පතිරාජවෙල නම් ප්‍රදේශයේ පිහිටි ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුවෙන් ගල් යුගයට අයත් සාක්ෂි සොයා ගෙන තිබේ. මෙම බොරලු තට්ටුව විද්‍යාත්මක විශ්ලේෂණය මගින් දින නිර්ණය කිරීමේ දී එය මින් පෙර වසර **125 000** ක් පැරණි බව තහවුරු වී තිබේ.

## ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ ජනාවාස ව්‍යාප්තව තිබූ පරිසර කලාප

අර්ධ ශුෂ්ක කලාපය


පහතරට වියළි කලාපය

පහතරට අතරමැදි වියළි කලාපය

තෙත් කලාපය

කඳුකර වියළි අතරමැදි කලාපය

ශුෂ්ක කලාපය





## ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ ජනාවාස

ගල් යුගයේ මානවයා තම ජනාවා සඳහා ස්ථානයක් තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ ප්‍රධාන කරුණු කිහිපයක් හඳුනා ගත හැකිය.

- ආහාර සඳහා අවශ්‍ය කරන සම්පත් පහසුවෙන් ලබාගත හැකිද යන්න
- ජල පහසුව
- ශිලා මෙවලම් තනා ගැනීමට අවශ්‍ය කරන පාෂාණ පහසුවෙන් ලබා ගත හැකි ද යන්න

ගල් යුගයේ මානවයා එළිමහන් සථාන වල ජීවත්වීමට වැඩි කැමැත්තක් දක්වා ඇති අතර වර්ෂා කාල වලදී ස්වභාවික ගල් ගුහා තම ජනාවාස ලෙස තෝරා ගෙන ඇත ඒ අනුව ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ ජනාවාස වර්ග දෙකකට බෙදා වෙන් කළ හැකිය.





1) එළිමහන් වාසස්ථාන

2) ස්වභාවික ගල් ගුහා

## එළිමහන් වාසස්ථාන


- වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන - මිනිහාගල්කන්ද, බුන්දල, පතිරාජවෙල
- තෙත් කලාපීය එළිමහන් වාසස්ථාන - බෙල්ලන්බැඳිපැලැස්ස
- කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන - බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න


## ස්වභාවික ගල් ගුහා

- පහතරට තෙත් කලාපීය ලෙන් - පාහියන්ගල,බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන
- පහතරට වියළි කලාපීය ලෙන් - සීගිරියේ පොතාන සහ අලිගල

## ජීවන රටාව හා ආහාර රටාව


ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා ආහාර සොයා යමින් සංචාරී දිවිපෙවතක් ගත කරන ලදි. එම යුගයේ මානවයා ආහාර සොයා දිනකට කාලෝ මීටර් 7 ක් පමණ දුරක් ඇවිද ගොස් ඇත් බව විශ්වාස කෙරේ. දඩයම ඔවුන්ගේ ප්‍රධානතම ජීවනෝපාය මාර්ගය වූ අතර ඊට අමතරව ආහාරයට ගත හැකි වනද්‍රව්‍ය රැස් කිරීමද සිදුව ඇත. මෙම යුගයේ මානවයින් තමන් ජීවත් වන පරිසරයෙන් පහසුවෙන් ලබා ගත හැකි දේ ආහාරයට ගෙන ඇත. තෙත් කලාපයේ විසූ මානවයින් එම කලාපයේ බහුලව ඇත් ගොඩබිම බෙල්ලන් බහුලව ආහාරයට ගෙන ඇති බවට සාදක හමු වේ. එසේම වියළි කලාපයේ ජීවත් වූ අය එම කළාපයේ බහුලව සිටින මුවා , තලගොයා වැනි සතුන් දඩයම් කර ආහාරයට ගෙන ඇත. මෙම යුගයේ මානවයා





විසින් දඩයම් කළ සතුන් අතර ගවරා, කු`ළු මීහරකා, ක`ළු වළහා, වල්ඌරා, ගෝනා, තිත්මුවා, මීමින්නා, ඉත්තෑවා,හාවා, දඬුලේනා, හම්බාවා, මුගටියා, උරුලෑවා, වඳුරා, වලිකුකුළා, හබන්කුකුළා සහ තලගොයා වැනි සතුන් ප්‍රධාන වේ. පිෂ්ටය ලබා ගැනීමට භාවිත කළ ශාක ආහාර අතර වල්දෙල් සහ කැලෑකෙසෙල් ප්‍රධාන ය. මෙම යුගයේ පසුකාලීන මානවයා ආහාර සඳහා ලුණු එක් කර ගත් බවටත් ආහාර පුළුස්සාගෙන අනුභව කළ බවටත් සාදක කිතුල්ගල බෙලි ලෙනෙන් හමු වේ. එම සාදක මීට වසර 12500 පමණ පැරණි බව පුරාවිද්‍යාඥයින් ගේ අදහසයි. මෙම ලෙනෙන් කැලෑදෙල් ඇට පුළුස්සා අනහව කළ බවට සාදක හමු වේ.

## ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ තාක්ෂණය



මෙම යුගයේ තාක්ෂණය සම්පූර්ණයෙන්ම පාෂාණ ශිලා මෙවලම් තනා ගැනීම මත රඳා පවතී. මෙම යුගයේ මානවයින් සතුන් දඩයම් කිරීම සඳහා ශිලා මෙවලම් භාවිතා කර ඇත. මෙම යුගයේ මුල්කාලීන මානවයා සතුන් දඩයම් කිරීම සඳහා කළුගල් භාවිතා කර නිපදවා ගන්නා ලද මිටි හා ඇඹරුම් ගල් වැනි රළුශිලා මෙවලම් භාවිතා කර ඇති අතර පසුකාලීන මානවයා (මධ්‍ය ශිලා යුගයේ ) ඊට වඩා දියුණු ජ්‍යාමිත හැඩයේ ක්ෂුද්‍ර ශිලා මෙවලම් නිපදවාගෙන ඇත ඒසඳහා ඔවුන් බහුල වශයෙන් යොදාගෙන ඇත්තේ බිම් වීදුරු නමින් හඳුන්වන පිරිසිදු තිරිවානා ගල්ය ඊට අමතරව කහද නමින් හඳුන්වන අර්ධ මැණික් විශේෂයක් ද භාවිතා කර ඇත. ශිලා මෙවනම් නිපද වීමේ දී වෙර පහර නොහොත් පීඩන ශල්කනය යොදාගෙන ඇත. රළු ශිලා මෙලම් වලට වඩා වැඩි කාර්යයන් ප්‍රමාණයක් ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් මඟින් ඉටු කර ගත හැකිය. දඩයම් කිරීම කැපීම්, සීරීම්, තැලීම්, හැරීම්,විදගැනීම් ආදිය එහිදී ප්‍රධාන වේ. මෙම මෙලම් ත්‍රිකෝණාකාර ත්‍රීපීසියමා කාර චන්ද්‍රාකාර හා අර්ධ චන්ද්‍රාකාර ආදී ජ්‍යාමිතික හැඩයන්නේ යුක්ත වන අතර සෙන්ටි මිටර 4.5 කට වඩා විශාල නොවේ. මෙම යුගයේ මානවයා ඇට සැකිලි වළදැමීමේ දී ගුරු ගල් ආලේප කිරීමක් සිදු කර ඇති බව පුරා විද්‍යාත්මක කැනීම් මඟින් තහවුරු වේ. එයින් තහවුරු වන්නේ මෙම මානවයා ගුරු ගල් යොදාගෙන සායම් සකස් කර ගැනීමේ තාක්ෂණයද දැක සිටි බවයි.

## ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ අභිචාර විධි

මෙම යුගයේ මානවයා ජීවිතයේ විවිධ අවස්ථා වලදී නොයෙක් අභිචාර විධි අනුගමනය කරන්නට ඇත. නමුත් මෙම යුගයේ අභිචාර විධි සම්බන්ධ සාදක හමුවන්නේ අභිචාර වධි සම්බන්ධයෙන් පමණි. සමස්ථයක් ලෙස බලන කළ මෙම යුගයේ පැවත ඇත්තේ

මලසිරුරු හෝ ඇට සැකිලි වළ දැමීමේ ක්‍රමයකි. තම පවුලේ සාමාජිකයෙකු මිය ගිය විට තමා ජීවත් වූ ගල් ලෙනෙහි නොගැඹුරු වළක් හාරා සිරුර නමා වකුටු කර වළ දැමීම සිදු කර ඇත. මෙම මෙම යුගයේ අවමංගල අභිචාර විධියක් ලෙස අධ්‍යයනය කරනු ලැබුව ද ඇතැම් විට එය මෙම යුගයේ තාක්ෂණයේ හා පාරිසරාත්මක සාදක වල ගැටලුවක් ද විය හැකි ය. ගල් ලෙනක් තුළ මිනිස් සිරුරක් වළ දැමීමට තරම් විශාල වලක් හාරා ගැනීමට අපහසු වන්නට ඇත. එසේම මෙම යුගයේ මානවයින් වළක් හාරා ගැනීම ලී කැබළි , අං කැබළි වැනි සරල උපකරණ භාවිතා කර ඇත. එමඟින් විශාල වළක් හාරා ගැනීම අපහසුය. කිතුල්ගල බෙලිලෙන ඇතුළත එලෙස මිහිදන් කළ පුද්ගලයින් 12 දෙනෙකුගේ ඇටසැකිලි සොයා ගැනිණි. විවෘත ස්ථානයක් වූ බෙල්ලන්බැඳිපැලැස්සේ ගල් යුගයට අයත් සොහොන් බිමෙහි ඇටසැකිලි 30 ක් තිබිණි.පාහියන්ගල ගල්ගුහාවෙන් අවධි කිහිපයකට අයත් පුද්ගලයින් 9 දෙනෙකුගේ ඇටසැකිලි කොටස් සොයා ගෙන ඇත.

ඇතැම් අවස්ථාවල සිරුර ගල් ලෙනෙන් පිටත වළදමා මාංශ කොටස් දියවී ගිය පසු ඇට සැකිල්ල ගොඩගෙන හිස් කඹලේ ඉදිරියට නෙරා ආ ස්ථාන කළු ගලක උලා ඔප මට්ටම් කර ගරු ගල් ආලේප කර වළ දමා ඇත ඒ පිළිබඳ සාදක පාහියංගල ගුහාවෙන් හමු වී ඇත. ඉහත ආකාරයටම ගුරු ගල් ආලේප කරන ලද දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද හිස් කබලක් රාවණා ඇල්ල ගුහාවෙන් හමු වී ඇත.

